# සීමාසහිත ගිනිගත්හේන විවිධ සේවා සමුපකාර සමිතිය

# අයදුම්පත් කැඳවීම

සීමාසහිත ගිනිගත්හේන විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 02/2019 චක්‍රලේඛ අනුව සුදුසුකම් සපුරන ලද මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියලුම අයදුම්පත් 2020-10-05 දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපැලෙන් ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන්කර **"ගරු සභාපති, සී/ස ගිනිගත්හේන විවිධ සේවා සමුපකාර සමිතිය, 'කෝප්සිටි', හැටන් පාර, ගිනිගත්හේන"** යන ලිපිනයට එවිය යුතුය.

සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය සමග අදාළ සහතිකවල ඡායා පිටපත් එවිය යුතු අතර, එසේ පිටපත් නොමැතිව සුදුසුකම් සනාථ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පතක්, අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් සමග මෑතකදී ගත් චරිත සහතික 02 ක් සහ පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකයද, වයස තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් සහ හැඳුනුම්පතෙහි පිටපතක්ද එවිය යුතුය.)

දැනටමත් සමුපකාර සමිතියක සේවයේ නියුක්ත අයෙකු තම සමිතිය මගින් ඉල්ලුම්පත් යොමුකළ යුතුවේ.

**ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම II**

**අභ්‍යන්තර විගණක - II සහ I**

**වැ.ප. අංක** : S.E.M.L. 02 : 05

**වැටුප් පරිමාණය** : 19,600-450X10-550X10-700X10=36,600

**වයස් සීමාව** : 18 - 45

**සුදුසුකම් :**

අ. පිළිගත් විශ්වවිද්‍යාලයක ගණකාධිකරණ/ කළමනාකරණය පිළිබඳ උපාධියක් තිබීම

හෝ

ආ. උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ/ වාණිජ ඩිප්ලෝමාව හෝ වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසාන පරීක්ෂණය සමත්වීම

හෝ

ඇ. මාස 09 කට නොඅඩු ගණකාධිකරණය/ බැංකු හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත්වීම සමග S.E.M.L., 02:06 වැ.ප. ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 03 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ මධ්‍යම කළමනාකරණ IV මට්ටමේ M.M.L. 03:09 වැ.ප. පොත් තබන්නා තනතුරේ වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ M.M.L. 03:10 වැ.ප. ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරේ වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

ඈ. මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ගණකාධිකරණය/ විගණනය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත්වීම සමග සමුපකාර ක්ෂේත්‍රය හා සම්බන්ධ පිළිගත් ආයතනයක අභ්‍යන්තර විගණක තනතුරේ වසරක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

(සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළයුතුය.)

**ගරු සභාපති,**
**සී/ස ගිනිගත්හේන වි.සේ.ස. සමිතිය,**
**2020-09-15 දින.**
**051-2242233, 051-2242710.**